# Government Notifications

## SRI LANKA EXPORT DEVELOPMENT ACT, No. 40 OF 1979

### Order under Section 14

BY virtue of powers vested in me by Section 14 (1) of the Sri Lanka Export Development Act, No. 40 of 1979, I, Malik Samarawickrama, Minister of Development Strategies and International Trade with the concurrence of the Minister of Finance, do by this Order declare that with effect from 12.11.......2016, a Cess shall be charged, levied and paid on all goods enumerated in Column III of the Schedule hereto at rates specified in the corresponding entry in Column IV in the same Schedule hereto, on the aggregate of a sum equivalent to their value for Customs duty purposes at the time of importation and a sum equivalent to ten per centum (10%) of such value, provided however, that;

(1) Wherever more than one rate is specified in Column IV of the Schedule hereto, the applicable rate for the purpose of calculating the Cess payable shall be that rate the application of which results in a higher amount being payable as Cess.

(2) The Cess hereby imposed shall not apply to;

(i) Ayurveda, Siddha and Unani raw and prepared drugs and medicinal plants specified by Notification published in *Gazette* by the Director General of Customs in consultation with the Secretary to the Ministry which is responsible to the subject of Ayurveda, and Ayurveda, Siddha and Unani preparations (other than cosmetics preparations) imported, subject to the approval of the Secretary to the Treasury.

(ii) Any product or preparation registered as drug or device under the Cosmetics Devices and Drugs Act.

(iii) Raw material, intermediate goods, parts and accessories to be used for the manufacture of fashion jewellery and containers for packing imported on the recommendation of the Secretary, Ministry of Industry and Commerce.

(iv) Goods for any specified project referred to in paragraph f (ii) of PART II of the First Schedule to the Value Added Tax Act, No. 14 of 2002, as identified by the Minister in charge of the subject of Finance, on which taxes are borne by the Government taking into consideration the economic benefit to the country.

(v) Following equipment, accessories and parts thereof, for use in agriculture and related activities, imported on the recommendation of the Secretary to the Ministry of Agriculture, subject to approval by the Director General of Customs:

Weather stations, green houses, poly-tunnels, sprinkler/misting systems, drip irrigation systems, fertigation systems, hydroponic systems, mulch films, pond liner, and shade for netting.

(vi) Multi-layered packing material consisting of laminates of papers, polyethylene film and aluminium foil, or of polyethylene and ethylene vinyl alcohol polymer used for packing of liquid milk, vegetable juice and fruit juice, imported on the recommendation of the Secretary of the Ministry of Industry and Commerce subject to approval by the Director General of Customs.

(vii) Import of samples in relations to business worth not more than Rs. 50,000/= subject to such terms and conditions as prescribed by the Director General of Customs.

(viii) Multi-layered sheets of polyethylene and polyvinyl alcohol where polyvinyl alcohol sheet is laminated between two polyethylene sheets, of a thickness exceeding 275 microns, whether or not printed, for the manufacture of tubes for packaging of tooth-pastes, cosmetics etc., imported on the recommendation of the Secretary to the Ministry of Industry and Commerce subject to approval by the Director General of Customs.

(ix) High density polyethylene sheets, of a thickness exceeding 0.5 mm and the width not less than 4.0 m, in role form, for aquaculture ponds lining, imported on the recommendation of the Secretary to the Ministry of Fisheries and Aquatic Resources Development subject to approval by the Director General of Customs.

The orders made under section 14 (1) of the Sri Lanka Export Development Act, No. 40 of 1979 and published in the *Gazette Extraordinary*, No. 1941/33 of 20.11.2015, *Gazette Extraordinary*, No. 1944/54 of 11.12.2015, *Gazette Extraordinary*, No. 1971/06 of 13.06.2016, *Gazette Extraordinary*, No. 1973/21 of 28.06.2016, *Gazette Extraordinary*, No. 1975/40 of 12.07.2016 and *Gazette Extraordinary*, No. 1981/32 of 23.08.2016 or any other order issued under the said section for imports are hereby rescinded.

# රජයේ නිවේදන

## 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත
## 14 වැනි වගන්තිය යටතේ නියෝග

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය, මලික් සමරවික්‍රම වන මම, මුදල් අමාත්‍යවරයාගේ ද එකඟත්වය ඇතිව 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 (1) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2016 ......නොවැම්බර්...... මස .....12..... වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, මෙහි උපලේඛනයේ III වැනි තීරුවේ දක්වා ඇති භාණ්ඩ මත ආනයනය කරන අවස්ථාවේ තීරු බදු කාර්යය සඳහා සලකන වටිනාකමට, එම වටිනාකමෙන් 10%ක අගයක් එකතු කළවිට ලැබෙන සමස්ත වටිනාකම මත එකී උපලේඛනයේ IV වැනි තීරුවේ ඒ සඳහා දක්වා ඇති අදාල අනුපාතයන් පරිදි, සෙස් බද්දක් නියම කොට අය කර ගත යුතු බව මෙම නියෝගය මගින් ප්‍රකාශයට පත් කරමි.

එසේ වුවද,

1. මෙම උපලේඛනයේ IV වැනි තීරුවේ එකකට වඩා වූ බදු අනුපාතිකයන් දක්වා ඇති විට, ගෙවිය යුතු සෙස් බද්ද ගණනය කිරීමේ දී අදාළ වන අනුපාතය වනුයේ, සෙස් බද්ද වශයෙන් වැඩි මුදලක් ගෙවිය යුතුවන අනුපාතය යි.

2. මෙමගින් පනවනු ලබන සෙස් බද්ද පහත අවස්ථාවන්හි දී අදාළ නොවේ :-

(I) භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියට යටත්ව ආනයනය කරන ලද (විලවුන් පිළියෙල කිරීම නොවන) ආයුර්වේද, යුනානි සහ සිද්ධ පිළියෙල කිරීම් සහ ආයුර්වේද සිද්ධ සහ යුනානි වෛද්‍ය ක්‍රම සඳහා උපයෝගී කරගනු ලබන හා එසේ උපයෝගී කරගනු ලබන බවට තත් කාලීන ආයුර්වේද විෂය අයත්වන අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුදැනුම ඇතිව රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයක් මගින් නිශ්චය කොට දක්වා ඇති සැකසූ හා නොසැකසූ ඖෂධ වර්ග සහ බෙහෙත් පැලැටි.

(II) විලවුන් උපකරණ සහ ඖෂධ පනත යටතේ ඖෂධ ලෙස හෝ උපකරණ ලෙස ලියාපදිංචි වී ඇති යම් නිෂ්පාදිතයක් හෝ පිළියෙල කිරීමක්.

(III) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත ආනයනය කරනු ලබන විලාසිතා ස්වර්ණාභරණ නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය, අන්තර් භාණ්ඩ, කොටස් හා උපාංග සහ ඇසිරීම සඳහා ගන්නා ඇසුරුම් බඳුන්.

(IV) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමුවන උපලේඛනයේ II කොටසේ (ඊ) (ii) ඡේදයේ දක්වා ඇති පරිදි රටෙහි ආර්ථික ප්‍රතිලාභය සැලකිල්ලට ගෙන, මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් හඳුනාගන්නා ලද සහ රජය විසින් බදු දරන්නා වූ යම් විශේෂිත ව්‍යාපෘතියක් සඳහා වූ භාණ්ඩ.

(V) කෘෂි කර්මාන්තයේ හා ඒ ආශ්‍රිත කටයුතු සඳහා යොදා ගැනීමට ආනයනය කරන ලද කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශ මත රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත් වූ පහත සඳහන් ආම්පන්න.

කාලගුණ ඒකක, හරිතාගාර, පොලිතීන් ගෘහ, දිය/තුහින ඉසින යන්ත්‍ර, බිංදු වැස්සුම් වාරි පද්ධති, පොහොර කිරීමේ පද්ධති, පස් රහිතව පැල වැවීමේ ක්‍රියාවලියට (හයිඩ්‍රොපෝනික්) යොදා ගන්නා පද්ධති, උෂ්ණත්ව පාලන හා වාතාශ්‍රය ලබාදෙන පද්ධති හා ඒවායේ කොටස් හා අමුද්‍රව්‍ය හා වසුන් ආස්කර, පොකුණු ආස්තරන, ආවරණ දෑ.

(Vi) දියර කිරි, එළවළු යුෂ හා පළතුරු යුෂ ඇසිරීම සඳහා අවශ්‍ය වන ආනයනය කරන ලද පොලිඑතිලීන් පටල සහ ඇලුමිනියම් ලෝපත් හෝ පොලිඑතිලීන් හා එතිලීන්, එතිලීන් බහු අවයවිකවලින් සමන්විත බහුපටල කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශ මත රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව.

(Vii) රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව ශ්‍රී ලංකා රුපියල් පනස් දහස (රු. 50,000/-) නොඉක්ම වූ වටිනාකමින් යුත් වාණිජමය කටයුතු සඳහා ආනයනය කරනු ලබන නියැදියන් (සාම්පල).

(viii) දත් බෙහෙත්, විලවුන් ආදී ද්‍රව්‍ය ඇසිරීමට අවශ්‍ය ටියුබ් නිෂ්පාදනය සඳහා ආනයනය කරනු ලබන ඝනකම මයික්‍රෝන 275 ට නොඅඩු මුද්‍රණය කල හෝ නොකල පොලිඑතිලීන් ස්ථිර දෙකකින් ආස්තරණය කරන ලද පොලිවිනල් මධ්‍යසාර ස්ථරයකින් සමන්විත බහු ස්ථර ප්ලාස්ටික් තහඩු, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව.

(ix) ජල පෝෂණ පොකුණු ආස්තරණය සඳහා ආනයනය කරනු ලබන පළල මීටර් 04 ට නොඅඩු හා ඝනකම මිලි මීටර 0.5 නොඉක්මවන අධි ඝනත්වයෙන් යුත් පොලිඑතිලින් ප්ලාස්ටික් තහඩු (HDPE) ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව

1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වගන්තිය යටතේ පනවනු ලදුව, 2015.11.20 දිනැති අංක 1941/33 දරන *අතිවිශේෂ ගැසට් නිවේදනය*, 2015.12.11 දිනැති අංක 1944/54 දරන *අතිවිශේෂ ගැසට් නිවේදනය*, 2016.06.13 දිනැති අංක 1971/06 දරන *අතිවිශේෂ ගැසට් නිවේදනය*, 2016.06.28 දිනැති අංක 1973/21 දරන *අතිවිශේෂ ගැසට් නිවේදනය*, 2016.07.12 දිනැති අංක 1975/40 දරන *අතිවිශේෂ ගැසට් නිවේදනය* හා 2016.08.23 දිනැති අංක 1981/32 දරන *අතිවිශේෂ ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශිත නියෝග ද එකී වගන්තිය යටතේ ආනයනය සම්බන්ධයෙන් පනවන ලද වෙනත් නියෝග ද ඇත්නම් එම නියෝග ද මෙමගින් අවලංගු කරමි.